

# දකුණු පළාත් සභාව
தென் மாகாண சபை
## SOUTHERN PROVINCIAL COUNCIL

**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகள் மற்றும் தகவல்நெடுஞ்சா துறை அமைச்சு
**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය", ලබුදුව, ගාල්ල.** கீழ் மாடி, "தக்சிண பாய", லபுகுவ, காலி, Ground Floor, "Dakshina Paya", Labuduwa, Galle.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } Sp/Edumin/Edu/4/2 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2023.04.06 |

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද සියලු අධ්‍යාපනවේදී උපාධිධාරීන් වෙත,

**<u>අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව අවසන් කරන ලද දකුණු පළාත තුල ස්ථිර පදිංචිය සහිත අධ්‍යාපනවේදී ගුරු සිසුන් සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා කැඳවීම.</u>**

උක්ත කරුණට අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය 2023.04.09 දින පෙ.ව.08.30 සිට **දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේදී** (දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය, ලබුදුව, ගාල්ල.) පැවැත්වේ. ඒ අනුව එදිනට පහත සඳහන් සහතික හා ලිපිලේඛනවල මුල් පිටපත් සමග සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලෙස ඔබට මෙයින් දන්වමි. එමෙන්ම එම සහතිකයන්හි ඡායා පිටපත්, ඔබ විසින් සත්‍ය පිටපත් බවට සහතික කර පහත අනුපිළිවෙළ අනුව කාඩ්බෝඩ් ලිපිගොනුවක සකස් කර රැගෙන ආ යුතු අතර, එහි **ඔබේ නම, ඔබේ අංකය** (වෙබ් අඩවියෙහි පළ කර ඇති ඔබේ නමට අදාළ අංකය) හා **පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වම් පස ඉහළ කෙළවරේ** සඳහන් කළ යුතුය.

1. ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය (නමේ වෙනසක් ඇතොත් දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.)
2. අ.පො.ස.(සා.පෙළ/උ.පෙළ) සහතිකවල මුල්පිටපත්
3. විස්තර සහිත උපාධි සහතිකයේ මුල් පිටපත්
4. මාස 06 ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක් (**මින් එකක් ඔබ පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතු ය. එහි ඔබේ ලිපිනය හා පදිංචිය කවදා සිට ද යන වග සඳහන් විය** යුතුය.)
5. ඔබගේ පදිංචිය තහවුරු වන පරිදි ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල යුතුය.
6. එමෙන්ම ඉහත දක්වා ඇති සියලුම ලේඛන සුදුසුකම් පරීක්ෂණ දිනයේදීම ඉදිරිපත් කළයුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාරගනු නොලැබේ.
7. ඔබ විසින් පුහුණුව ලද විෂයයට අදාළ ව පහත දක්වා ඇති පරිදි මිනිත්තු 05ක කාලයක් තුල තෝරා ගත් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය.
8. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබට නියමිත වේලාවට මිනිත්තු 15 කට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණීම අනිවාර්යය වේ.

රංජිත් යාපා
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත

**රංජිත් යාපා**
ලේකම්,
අධ්‍යාපන, ඉඩම්... අමාත්‍යාංශය,
දකුණු පළාත.


**ගරු අමාත්‍යතුමා** / கௌரவ அமைச்சர் / Hon. Minister } 091-2246159
**ලේකම්** / செயலாளர் / Secretary } 091-2246156, 091-2030701
**කාර්යාල** / காரியாலயம் / Office } 091-2030708 **පාලන**/நிர்வாகம்/Administration; 091-2030705 **අධ්‍යාපන**/கல்வி/Education; 091-2030703 **සැලසුම්**/திட்டமிடல்/Planning
**ෆැක්ස්** / பெக்ஸ் / Fax } 091-2246157, 091-2246156, 091-2234044

## <u>ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය:</u>

(i). ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

**නිර්ණායකයන්හි අරමුණු:**

| | | |
|---|---|---|
| i | අරමුණ හා ප්‍රවිශ්ට වීම | සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම. |
| ii | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iii | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iv | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණු කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම. |
| V | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණු කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම. |